සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2007 වර්ෂයේ ඔක්තෝබර්-දෙසැම්බර් කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

2010.08.20 දින පළ වූ අංක 1,668 දරන *ගැසට් පත්‍රයේ* I-III සහ IV(අ) කොටස් පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,669 - 2010 අගෝස්තු මස 27 වැනි සිකුරාදා - 2010.08.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1470 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 සැප්තැම්බර් මස 03 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අගෝස්තු මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

ඇමුණුම :- 03

## වයඹ පළාත් සභාව

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ වයඹ පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උප වගන්තිය අනුව මෙයින් පළ කරනු ලැබේ.

### යෝජනාව

2009.08.26 වැනි දින කොබෙයිගනේ ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවති මාසික මහා සභා රැස්වීමේ දී යෝජනා සම්මත කර ගත් පරිදි "විනෝද බදු ආඥාපනතේ දෙවැනි වගන්තියේ i වැනි උප වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයෙ හි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) 15% ක් සමාන බද්දක් පනවා අය කළ යුතු යැයි ද,

මෙම යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පළ කරන ලද මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ සිට ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටයක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අය කළ යුතු බදු මුදල එසේ ගෙවන ලද ගාස්තුවෙන් 7.5%ක් විය යුතු බව ද, සභාව යෝජනා කරන්නීය".

අතුළ සරත් කුමාර විජේසිංහ.
(ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රම සම්පාදන
නීතිය හා සාමය, පළාත් පාලන පළාත්
පරිපාලනය, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික
කටයුතු, පරිසර, නිවාස සහ ඉදිකිරීම්
කර්මාන්ත හා ග්‍රාමීය කර්මාන්ත සහ
වනිතා කටයුතු අමාත්‍යාංශය).

2010 ජූලි මස 14 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ දී ය.

08-571

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.